# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

---

# 1990 අංක 05 දරන
# වයඹ ස්වයං රැකියා පදනම් ප්‍රඥප්තිය

---

[අනුමත කළ දිනය : 1990.09.07]

වයඹ පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 අගෝස්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ IVඅ කොටසේ පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිලදී ගත හැක.

මිළ : රු. 5.00 තැපැල් ගාස්තුව : රු. 2.00

# වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 05 දරන වයඹ ස්වයං රැකියා පදනම් ප්‍රඥප්තිය

වයඹ ස්වයං රැකියා පදනම ස්ථාපනය කිරීම පිණිසද, පදනමේ පාලක මණ්ඩලය ඇති කිරීමට හා එම මණ්ඩලයේ බලතල, කාර්ය හා කටයුතු නිශ්චය කිරීම පිණිසද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 05 දරන වයඹ ස්වයං රැකියා පදනම් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේය. *කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

## I වන කොටස

## වයඹ ස්වයං රැකියා පදනම

2. (1) මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන "වයඹ ස්වයං රැකියා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් පිහිටුවනු ලැබේ. *වයඹ ස්වයං රැකියා පදනම පිහිටුවීම.*

(2) (1) වන උපවගන්තියෙන් පදනමට දී ඇති නාමයෙන් ඒ පදනම අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වියයුතු අතර, එම නාමයෙන් පදනම විසින් නඩු පැවරීමද, පදනමට විරුද්ධව නඩු පවරනු ලැබීමද කරනු ලැබිය හැකිය.

3. (1) මෙහි මින්මතු පාලක මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන වයඹ ස්වයං රැකියා පදනමෙහි පාලක මණ්ඩලයක් පිහිටුවනු ලැබේ. *පදනමෙහි පාලක මණ්ඩලය.*

(2) වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් තුන්වන සහ හතරවන අනුච්ඡේදයේ විධිවිධානවලට යටත්ව පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා සාමාජිකයන් හය දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් පාලක මණ්ඩලය සමන්විත විය යුතුය.

(3) පහත සඳහන් අය තිල බලයෙන් පාලක මණ්ඩලයෙහි සාමාජිකයන් විය යුතුය :

(අ) ප්‍රධාන අමාත්‍යවරයාගේ ලේකම්,

(ආ) වයඹ පළාතේ සමුපකාර කොමසාරිස්,

(ඇ) කෘෂි සංවර්ධන අධිකාරියේ වයඹ පළාත් අධ්‍යක්ෂ.

(4) පාලක මණ්ඩලයෙහි සෙසු සාමාජිකයන් පහත සඳහන් පරිදි පත්කළ යුතුය :

(අ) වයඹ පළාතේ සමුපකාර මහා සංගමයේ නියෝජිතයෙක්,

(ආ) වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ නියෝජිතයෙකු වශයෙන් ගණකාධිකාරිවරයෙක්,

(ඇ) තරුණ සේවා සභාවේ නියෝජිතයෙක්,

(ඈ) ප්‍රධාන අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි පත් කරනු ලබන රජයේ සේවකයෙකු නොවන අයෙකු.

(5) ඉහත 4 වන අනුච්ඡේදය යටතේ පත් කරනු ලැබූ සෑම සාමාජිකයෙක්ම ඉල්ලා අස්වීමෙන් හෝ මියයාමෙන් හෝ පදවියෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ තනතුරු දැරීම අවසන් වුවහොත් හැරෙන්නට ඔහු පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් එම ධුරය දරනු ඇත.

(6) ඉහත 4 වන අනුච්ඡේදය යටතේ පත් කරනු ලැබූ ඕනෑම සාමාජිකයෙකුට ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිපියක් ඉදිරිපත් කර ඕනෑම අවස්ථාවකදී මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකිය.

(7) ඉහත 4 වන අනුච්ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකුගේ පත්වීම ප්‍රධාන අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි අතර, එසේ කිරීම කිසිදු අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් හෝ ඉදිරියේ අභියාචනයක්, ආඥවක් නැතහොත් මොනයම් ආකාරයකින් හෝ ප්‍රශ්න නොකළ යුතුය.

(8) ඉල්ලා අස්වීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් හෝ ඉවත්වන්නා වූ සාමාජිකයකු නැවත පත්කරනු ලැබිය හැකිය.

(9) ධුරය දැරීම අහෝසිවීමෙන් පුරප්පාඩු වූ යම් ධුරයකට පත් කරනු ලැබූ අනුප්‍රාප්තිකයකු ධුරය දරනු ලැබිය යුත්තේ පූර්වගාමියාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහාය.

(10) පාලක මණ්ඩලයේ සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට වයඹ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව ප්‍රධාන අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය.

පාලක මණ්ඩලයේ කාර්ය පරිපාටිය.

4. (1) සභාපතිවරයා පාලක මණ්ඩලයේ සියළු රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයින් විසින්, තමන් අතුරෙන් කවර හෝ සාමාජිකයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතුය.

(2) පාලක මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයින් තුන්දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, පාලක මණ්ඩලය විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් සිය කාර්යය විධානය විධිමත් කර ගත හැකිය.

(3) පාලක මණ්ඩලය පදනමේ කටයුතු පාලනය කළයුතු අතර, බලතල හා වගකීම් ක්‍රියාත්මක කිරීම ද කළ යුතුය.

(4) (අ) පාලක මණ්ඩලයට තම බලතල හා වගකීම් සභාපතිට, කමිටු සාමාජිකයෙකුට හෝ සේවකයෙකුට පැවරිය හැකිය.

(4) එකී බලතල හෝ වගකීම් පවරනු ලැබූ සෑම පුද්ගලයෙක්ම එම බලතල හෝ වගකීම් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම, පාලක මණ්ඩලයේ විශේෂ හෝ සාමාන්‍ය විධිවිධානයන්ට යටත්ව කළ යුතුය.

(5) පාලක මණ්ඩලයේ යම් රැස්වීමකදී තීරණයක් ගැනීමට ඇති සියළු කරුණු පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය. පක්ෂව හා විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට හෝ මුලසුන දරන සාමාජිකයාට තීරණ ඡන්දයක් තිබිය යුතුයි.

(6) පාලක මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයෙකු පත් කිරීමෙහි ලා කිසියම් දෝෂයක් තිබීමේ හෝ හේතුවෙන් පමණක් බල රහිත නොවිය යුතුය.

(7) පාලක මණ්ඩලයට ලේකම්වරයෙකු සිටිය යුතුය. කමිටුවේ සාමාජිකයින් අතුරින් එක් අයෙකු ලේකම්වරයෙක් ලෙස පත් කරනු ලැබිය යුතුය.

## II කොටස

### වයඹ ස්වයං රැකියා පදනමේ පාලක මණ්ඩලයේ බලතල

5. (1) වයඹ ස්වයං රැකියා පදනමේ මුදල් නිශ්චිත කාර්ය සඳහා හඳුනාගත් ව්‍යවසායකයින් වෙත ගෙනයාමට සුදුසු ආයතන තීරණය කිරීම පාලක මණ්ඩලය විසින් කළ යුතුය. පාලක මණ්ඩලයේ බලතල.

(2) පදනමින් මුදල් ආයෝජනය කර ආරම්භ කළ හැකි ව්‍යාපෘතීන් තීරණය කිරීම කමිටුව විසින් කළ යුතුය.

(3) වයඹ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව ආයෝජනය කරනු ලබන මුදල් සඳහා පොළී ප්‍රතිශතය අය කළ යුතුය. එම පොළී ප්‍රතිශතයෙන් යම් ප්‍රමාණයක් සේවා ගාස්තු වශයෙන් 1 වන අනුඡේදය මගින් තීරණ කරන ලද ආයතනවලට ගෙවිය යුතුය.

(4) පදනමේ බැංකු ගිණුමක් අනුමත බැංකුවක පවත්වාගෙන යා යුතු අතර, තැන්පත් ගිණුම් අවශ්‍ය පරිදි විවෘත කිරීමේ බලය පාලක මණ්ඩලය සතුය.

(5) පදනමේ අරමුදලට ලැබෙන පොළිය මෙම පදනමේ ප්‍රචාරක කටයුතු සඳහා සහ අරමුදලේ කටයුතු සඳහා වියදම් දැරීමට පාලක මණ්ඩලයට යොදගත හැකිය.

(6) පදනමේ අරමුදලේ භාරකාරීත්වය පාලක මණ්ඩලය සතුය.

(7) පදනමේ අරමුදල් ආයෝජනය පිළිබඳව නීතිරීති සකස්කර ගැනීම පාලක මණ්ඩලය විසින් කළ යුතු අතර, එවැනි නීතිරීති ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

(8) මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් ඉටුකිරීම පිණිස ගිවිසුම්වලට බැඳීමට හා වෙනත් අන්දමේ අවශ්‍ය කාර්යයන් කිරීමට පාලක මණ්ඩලයට බලය ඇත.

(9) පදනම වෙනුවෙන් ගිවිසගත් ගිවිසුම් සඳහා පදනමේ අරමුදලින් ගෙවීම් කිරීමක්, වියදම් දැරීමක් කළ යුතු අතර, පදනම වෙනුවෙන් ගිවිසගත් ගිවිසුම්වල සියලුම ලැබීම් පදනමේ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(10) පදනමේ පාලක මණ්ඩලයට-

(අ) පදනමේ කටයුතු සඳහා අවශ්‍යවන නිලධාරීන් සහ සේවකයින් යොදවා ගැනීමටත්,

(ආ) එවැනි නිලධාරීන්ගේ හා සේවකයින්ගේ විනය පාලනය කිරීමට හා සේවය අවසන් කිරීමටත්

බලය තිබිය යුතුය.

(11) පදනමේ පාලක මණ්ඩලය විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව තීරණය කරනු ලබන වැටුප් හෝ පාරිශ්‍රමික ඒ නිලධාරීන්ට හා සේවකයින්ට ගෙවිය යුතුය.

(12) බොල් ණය පදනමේ අරමුදලින් කපා හැරීමට හා පදනමේ කටයුතු සඳහා අරමුදලෙන් මුදල් වැය කිරීමට පාලක මණ්ඩලයට බලය ඇත.

(13) පාලක මණ්ඩලයට මඟපෙන්වීම සඳහා අවශ්‍යවේ යයි සළකන අවස්ථාවලදී උපදෙස් නිකුත් කිරීමේ බලය වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා සතුය.

ගිණුම් කාර්ය පරිපාටිය.

6. (1) ප්‍රධාන ලේකම්වරයා විසින් උපදෙස් දෙනු ලබන ආකාරයට පාලක මණ්ඩලය විසින් අරමුදල් පිළිබඳ ගිණුම් තබා ගැනීම කළ යුතුය.

(2) පාලක මණ්ඩලයේ සභාපතිවරයා විසින් අර්ධ වාර්ෂිකව පදනමේ අරමුදල් ආයෝජනය පිළිබඳ ප්‍රගතිය ප්‍රධාන අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතුය.

(3) පදනමේ මුදල් වර්ෂය ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භව දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

(4) අරමුදලේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයෙකු ලවා විගණනය කිරීමට සැලැස්විය යුතු අතර, එකී විගණකවරයා ආදායම් සහ වියදම් සහ වියදම් වාර්තාවක් සමග පසුගිය අවුරුද්ද තුළ අරමුදලේ කාර්යයන් පරිපාලනය කිරීම ගැන වාර්තාවක් පිළියෙල කළ යුතුය.

(5) මණ්ඩලය විගණකවරයාගේ වාර්තාව ලැබුණු පසු ප්‍රායෝගික වශයෙන් කළ හැකි වහාම පසුගිය වසරේ අරමුදලේ ක්‍රියාවන් පරිපාලනය පිළිබඳ තම වාර්තාව, විගණකවරයාගේ වාර්තාව සමග ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රධාන අමාත්‍යවරයා එම වාර්තාව පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

(6) මෙම වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යනුවෙන් අදහස් වන්නේ -

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් ආයතනයක සාමාජිකයෙකු වූද, ඒ ආයතනයේ සභාව විසින් ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූද තැනැත්තෙක් හෝ ;

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකුව සිටින්නේද එමෙන්ම ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් වේ.

පදනමේ අරමුණු.

7. මෙම පදනම මගින් –

(අ) වයඹ පළාත තුළ ජීවත්වන අඩු ආදායම් ලබන පුද්ගලයින් සඳහා ආදායම් උත්පාදන මාර්ගයක් ඇති කිරීම, සහ

(ආ) ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීම තුළින් නිෂ්පාදනය වැඩි කිරීම සහ ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම

අරමුණු කරනු ලැබිය යුතුය.

පදනමේ අරමුදල.

8. (1) වයඹ පළාතේ පළාත් සභාව මගින් වරින් වර නිදහස් කරනු ලබන මුදල්වලින් වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරනු ලබන දේශීය හා විදේශීය මුදල් පරිත්‍යාගයන්ගෙන්ද මෙම අරමුදල සමන්විත වන්නේය.

(2) මෙම පදනමේ අරමුදල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවසාන තීරණය වයඹ පළාතේ අමාත්‍ය මණ්ඩලය සතුය.

අර්ථ නිරූපනය.

9. මෙම ප්‍රඥප්තියෙහි, අන්‍යාකාරයකින් සඳහන් වුවහොත් හැරෙන්නට–

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාද,

"ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාද,

"අනුමත බැංකුව" යන්නෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව අදහස් කෙරේ.